# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්/විදුලි/ප්‍රමාණ සමීක්ෂක), සැලසුම් ශිල්පී තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා වයඹ පළාතේ ස්ථිර පදිංචි සුදුසුකම් ලත් ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයෙන්ම අයැදුම්පත් කැඳවනු ලැබේ.

| *සංකේත අංකය* | *තනතුරු නාමය* |
|---|---|
| 01 | කාර්මික නිලධාරී (සිවිල්) III ශ්‍රේණිය |
| 02 | කාර්මික නිලධාරී (සිවිල්) එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය |
| 03 | කාර්මික නිලධාරී (සිවිල්) දෑ අවුරුදු පුහුණු ශ්‍රේණිය |
| 04 | කාර්මික නිලධාරී (විදුලි) III ශ්‍රේණිය |
| 05 | කාර්මික නිලධාරී (විදුලි) එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය |
| 06 | කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) III ශ්‍රේණිය |
| 07 | කාර්මික නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය |
| 08 | සැලසුම් ශිල්පී එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය |

මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2020 ජනවාරි මස දී කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

01. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-*

ඉහත සඳහන් සියලු තනතුරු සඳහා,

*(අ) අධ්‍යාපන සුදුසුකම් :-*

භෞතික විද්‍යාව හා ගණිතය යන විෂයයන් සහිතව ගණිතය විෂයය ධාරාවට අයත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එකවර සමත්වීම ;

*සහ*

සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

*සැ. යු.*- ඉහත අධ්‍යාපන සුදුසුකම් සමග එක් එක් තනතුර සඳහා පහත වෘත්තීය සුදුසුකම් ද සම්පූර්ණ කර තිබිය යුතුය.

*(ආ)* වෘත්තීය සුදුසුකම් :-

| *තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| කාර්මික නිලධාරී (සිවිල්/විදුලි) III ශ්‍රේණිය | i. මොරටුව විශ්වවිද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය මගින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; *හෝ*<br>ii. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය මගින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; *හෝ*<br>iii. අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; හෝ |

| *තනතුරු නාමය* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| | iv. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය මගින් තනතුරට අදාල ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ; *හෝ*<br><br>v. ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන තනතුරට අදාල ක්ෂේත්‍රයේ ඉංජිනේරු විභාගයේ 1 වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම ; *හෝ*<br><br>vi. රැකියා ක්ෂේත්‍රයට අදාලව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම ; *හෝ*<br><br>vii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| කාර්මික නිලධාරී (සිවිල්/ විදුලි/ප්‍රමාණ සමීක්ෂණ) එක් අවුරුදු පුහුණු ශ්‍රේණිය | i. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ජාතික තාක්ෂණ සහතික පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම ; *හෝ*<br><br>ii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |
| කාර්මික නිලධාරී (සිවිල්) දෑ අවුරුදු පුහුණු ශ්‍රේණිය | වෘත්තීය සුදුසුකම් අදාළ නොවේ. |
| සැලසුම් ශිල්පී (එක් අවුරුදු පුහුණු කාලය) පුහුණු ශ්‍රේණිය | i. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම ;<br>*හෝ*<br>ii. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමානයැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම. |

*සැ.යු.*- ඉහත සියලු අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් 2019.12.06 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතුයි.

02. *වෙනත් සුදුසුකම් :-*

2.1 අයැදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

2.2 සෑම අපේක්ෂකයෙකුම වයඹ පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

2.3 අයැදුම්පත් භාරගන්නා අවසන් දිනට වසර 03 ක වයඹ පළාතේ ස්ථිර පදිංචිය ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ප්‍රාදේශීය ලේකම්වරයා අනු අත්සන් කරන ලද ග්‍රාම නිලධාරී සහතිකයක් මඟින් පදිංචිය සනාථ කළ යුතුය. විවාහය මත වයඹ පළාත තුළ ස්ථිර පදිංචියට පැමිණි අයෙකු නම් ඒ බව සනාථ කළ යුතුය.

2.4 අදාළ තනතුර සඳහා බඳවාගනු ලැබුවහොත් අවම වශයෙන් වසර 10 ක් වයඹ පළාත තුළ සේවය කළ යුතු වේ.

2.5 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

2.6 තනතුරට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

*සංලක්ෂය :-*

යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.

03. *වැටුප් පරිමාණය :-*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2016.02.25 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I හි MN 3 - 2016 අනුව,
රු. 31,040 - 10 x 445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු.57,550/- වේ.
(2020.01.01 දක්වා එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් ගෙවනු ලැබේ.)

04. *සේවා කොන්දේසි :-*

4.1 මෙම තනතුර ස්ථිරය. සේවයට අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් වේ.

4.2 මෙම තනතුරට පත් කරනු ලබන්නන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේ නම් හා අනෙකුත් සේවය ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

4.3 රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණ නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළදී ලබා ගත යුතුය.

4.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව සේවයට බැඳී වසර 05 ක් ඇතුළත සේවයට බැඳුණ භාෂා මාධ්‍යයට අතිරේක වශයෙන් අනෙකුත් රාජ්‍ය භාෂාව/ භාෂා පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

4.5 III වන ශ්‍රේණියේ වසර 05ක් ඉක්මවීමට පෙර ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අ.පො.ස. (සා.පෙළ) සම්මාන මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය.

4.6 මෙම තනතුර සඳහා වන බඳවා ගැනීමේ / උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි හා ඒ අනුව පැවරෙන කාර්යභාරයට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, වයඹ පළාත් කාර්ය පටිපාටික රීති, වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයට හා විනය කාර්යය සංග්‍රහයටද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සහා තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවට ද, රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසිවලට හා නියෝගවලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියලු නිලධාරීන් බැඳී සිටී.

05. *දෑ අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගනු ලබන නිලධාරීන් සඳහා විශේෂ කොන්දේසි :-*

5.1 විවෘත ධාරාවෙන් හා සීමිත ධාරාවෙන් පුහුණු කිරීමේ ශ්‍රේණියට බඳවා ගන්නා නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම සඳහා අනෙකුත් කොන්දේසිවලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කළ යුතුයි.

*(අ)* පුහුණු කිරීමේ ශ්‍රේණියට පත්වී අවුරුදු 04 ක් තුළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරකට අදාළ ක්ෂේත්‍රයක සතිඅන්ත සති 03 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණික සහතිකය ලබාගැනීම. (උදා. ජාතික තාක්ෂණික සහතිකය සිවිල්/විදුලි/යාන්ත්‍රික/ප්‍රමාණ සමීක්ෂණ)

*හෝ*

*(ආ)* පුහුණු ශ්‍රේණි සඳහා බඳවා ගනු ලබන නිලධාරීන් වයඹ පළාත් සභාව විසින් පිළිගනු ලබන ආයතනයක තනතුරට අදාල ක්ෂේත්‍රයේ නේවාසික පුහුණු පාඨමාලාවක් සාර්ථකව හදාරා NVQ 5 සහතිකය ලබා ගැනීම. (මෙම නේවාසික පුහුණු පාඨමාලාව හැදෑරීමට පෙර අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා සමග ගිවිසුම් ගතවිය යුතුය.)

06. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

6.1 ලිඛිත තරග විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. විභාග විෂය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙළ අනුව ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. ප්‍රමුඛතා ලේඛනයේ අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරාගනු ලැබේ. අදාළ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු වූ විට එම අයට ලිඛිත විභාගයකින් තොරව සම්මුඛ පරීක්ෂණයකින් පමණක් බඳවා ගනු ලැබේ.

6.2 සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ලබා දීමක් සිදු නොකරන අතර අධ්‍යාපන, වෘත්තීය ඇතුළු මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා ශාරීරික යෝග්‍යතාව පරීක්ෂා කර බැලීම සිදු කරනු ලැබේ.

6.3 III වන ශ්‍රේණියට සෘජුව බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් සිටින විට III වන ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

6.4 III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලැබූවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක ඉතිරි පුරප්පාඩු සඳහා එක් අවුරුදු පුහුණු ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. එසේ බඳවා ගන්නා ලද අයදුම්කරුවන් එක් අවුරුදු පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පවත්වන විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

6.5 එක් අවුරුදු පුහුණු ශ්‍රේණියට ද බඳවා ගැනීමෙන් අනතුරුව තවදුරටත් පුරප්පාඩු පවතීනම් දෑ අවුරුදු පුහුණු ශ්‍රේණියට බඳවා ගනු ලැබේ. එම අයදුම්කරුවන් දෙවසරක පුහුණු කාල සීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව පවත්වන විභාගය සමත් වීමෙන් පසු III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

*සටහන :*

ඉහත පුහුණු කාල සීමාව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගයෙන් අසමත් වන ආධුනිකයන්ගේ සේවය අවසන් කරනු ලැබේ.

6.6 පවතින පුරප්පාඩු ප්‍රමාණයෙන් 70% ක් විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත පුරවනු ලැබේ.

07. *ලිඛිත විභාගය :*

7.1 ලිඛිත විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන මාධ්‍යයකින් ඉල්ලුම් කළ හැකි අතර, ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.
7.2 මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. සවිස්තරාත්මක විභාග විෂය නිර්දේශයන් පහත පරිදි වේ.
7.3 දෑ අවුරුදු පුහුණු ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ දී විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය අදාළ නොවේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් වීම සඳහා ලබා ගත යුතු ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40% |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40% |

*විභාග විෂයය නිර්දේශය :*

01. බුද්ධි පරීක්ෂණය :

අයදුම්කරුවන්ගේ භාෂා හැකියාව, ගණිතමය කුසලතාවය සහ තර්කන ශක්තිය මැන බැලීම සඳහා සකස් කරනු ලබන කෙටි හා බහුවරණ ශෛලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ.

02. *විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය.-*

*(අ)* **කාර්මික නිලධාරි (සිවිල්) III ශ්‍රේණිය, කාර්මික නිලධාරි (සිවිල්) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය**

ගොඩනැගිලි ඉදිකිරීමේ මූලධර්ම, ඉදිකිරීමේ කාර්ය සඳහා පිඹුරුපත් සකස් කිරීම හා කියවා වටහා ගැනීමේ හැකියාව, ජල සම්පාදනය හා ජලවහනය, අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියා පිළිබඳව අපේක්ෂකයා සතු සහජ හැකියාව විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ.

*(ආ)* **කාර්මික නිලධාරි (විදුලි) III ශ්‍රේණිය, කාර්මික නිලධාරි (විදුලි) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය**

විදුලි පරිපථ සැලැස්මක් කියවා වටහා ගැනීමේ හැකියාව, විදුලි පිහිටැවුමකදී අනුගමනය කළ යුතු රෙගුලාසි පිළිබඳ දැනුම, ඉදිකිරීම්, වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතුවලට අදාළ විදුලි පරිපථ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම පිළිබඳ දැනුම.

*(ඇ)* **සැලසුම් ශිල්පී එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය**

ගොඩනැගිලි නිර්මාණ ශිල්පය පිළිබඳ දැනුම, ප්‍රමාණයට අනුව ඇඳීම, සැලැස්මක් හෝ දළ සටහනක් තේරුම් ගැනීමේ හැකියාව, ව්‍යුහගත නිර්මාණයන් පිළිබඳ මූලික දැනුම, සමීක්ෂණ පිළිබඳ දැනුම, ජ්‍යාමිතික හා යාන්ත්‍රික ඇඳීම පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න ඇතුළත් වනු ඇත.

*(ඈ)* **කාර්මික නිලධාරී (යාන්ත්‍රික) III ශ්‍රේණිය, කාර්මික නිලධාරී (යාන්ත්‍රික) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය)**

වාහනයක් පනගන්වා හෝ පදවා දෝශ සොයාගැනීමේ දැනුම, වාහනවල පවතින පද්ධති වර්ග පිළිබඳ දැනුම. (නවීන වාහනද ඇතුළුව), ඇස්තමේන්තු සෑදීම සහ පරීක්ෂා කිරීම, වාහන වායුසමීකරණ පද්ධති, ක්‍රමානුකූල නඩත්තුව මඟින් වාහන සහ අමතර කොටස්වල කල්පැවැත්ම වැඩි කිරීම, වායු සහ විදුලි පැස්සීම පිළිබඳ දැනුම, වාහන විදුලි පද්ධති පිළිබඳ දැනුම, ද්‍රව පීඩන පද්ධති පිළිබඳ දැනුම, ජල පොම්ප නිවැරදිව තෝරා ගැනීම සහ අලුත්වැඩියාව.

*(ඉ)* **කාර්මික නිලධාරි (ප්‍රමාණ සමීක්ෂක) III ශ්‍රේණිය, කාර්මික නිලධාරි (ප්‍රමාණ සමීක්ෂක ) එක් අවුරුදු පුහුණු කිරීමේ ශ්‍රේණිය.**

සම්මත ප්‍රමිතීන් (SLS 573) භාවිතා කරමින් ප්‍රමාණ පත්‍ර සැකසීම, තක්සේරු ශිල්ප ක්‍රම භාවිතයෙන් ඇස්තමේන්තුකරණය, කොන්ත්‍රාත් කොන්දේසි (CIDA/SBD) භාවිතය, ගෙවීම් ක්‍රියාවලිය සඳහා සාමූහික මිනුම් ලබා ගැනීම, අතුරු සහ අවසන් ගිණුම් පරීක්ෂා කිරීම, කොන්ත්‍රාත් විචලනය.

08\. *විභාග ගාස්තු :*

විභාග ගාස්තු වශයෙන් රු. 600/- ක මුදලක් වයඹ පළාත් සභාවේ අංක 2003-02-13 දරන ආදායම් ශීර්ෂයට බැරවන පරිදි ගෙවිය යුතුය. වයඹ පළාතේ පදිංචි අයදුම්කරු/ අයදුම්කාරිය තමන් ස්ථිර පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවා ලබා ගත් ව.ප.ස.මු. 02 ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ලදුපත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බව ද, එම විභාග ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩ දෙනු නොලබන බව ද සැලකිය යුතුය.

09\. *අයදුම් කළ යුතු ක්‍රමය :*

9.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කරගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2019.12.06 වැනි දින හෝ එදිනට ප්‍රථම **"ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි, **"වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරී (සිවිල්/විදුලි/ප්‍රමාණ සමීක්ෂක), සැලසුම් ශිල්පී තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019"** යනුවෙන් සඳහන් කළ යුතුය.

9.2 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හෝ නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද, සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

9.3 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 32,960/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

9.4 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2019.12.06 වේ.

10. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :*

අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලේඛනයකින් විභාග ශාලාධිපතිට තහවුරු කළ යුතුය.

*(අ)* පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත.
*(ආ)* වලංගු විදේශ ගමන් බලපත්‍රය

*සටහන :*

විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

12. ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. එම තොරතුරු කිසිදු අයුරකින් සංශෝධනයට ඉඩදෙනු නොලැබේ. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවකු විභාගයට පෙනී සිටීමට නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය වයඹ පළාත් සභා රාජ්‍ය සේවයෙන් පහ කිරීමට පිළිවන.

13. *විභාග ප්‍රවේශපත්‍ර :*

විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (www.psc.nw.gov.lk) වෙබ් අඩවියේ නිවේදනයක් පළකරනු ලැබේ. විභාගය පැවැත්වෙන දිනට දින 03 කට පෙර විභාග ප්‍රවේශපත්‍රය නොලැබුණි නම්, වහාම වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත පහත සඳහන් විස්තර සහිතව දැන්විය යුතුය. විභාග අපේක්ෂකයන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍ර ඉදිරිපත් කළ යුතුය.

(i) විභාගයේ නම ;
(ii) අයදුම්කරු / අයදුම්කාරියගේ සම්පූර්ණ නම ;
(iii) ජාතික හැඳුනුම්පත් අංකය ;
(iv) ලිපිනය ;
(v) අයදුම්පත්‍රය තැපැල් කළ දිනය හා ලියාපදිංචි කළ විස්තර.

14. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම / නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ආර්. එම්. ආර්. එම්. රත්නායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

2019 නොවැම්බර් මස 04 වැනි දින.

ආදර්ශ අයදුම්පත්‍රය

[ ]

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරි (සිවිල්/විදුලි/ප්‍රමාණ සමීක්ෂක), සැලසුම් ශිල්පී තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2019**

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ කොටුවේ √ ලකුණ යොදන්න.)

සිංහල - [ ] දෙමළ - [ ] ඉංග්‍රීසි - [ ]

| *ඉල්ලුම් කරන තනතුර/තනතුරු නාමය* | *සංකේත අංකය* |
|---|---|
| | |
| | |
| | |

01. 1.1 මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :............................................................................................

.................................................................................................................................මයා/මිය/මෙනවිය

1.2 මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Ms./Mrs. ..............................................................................

.................................................................................................................................

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :........................................................................................................

.................................................................................................................................මයා/මිය/මෙනවිය

1.4 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : Mr./Ms./Mrs. ......................................................................................

.................................................................................................................................

1.5 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

02. 2.1 ස්ථිර පදිංචි ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) : ............................................................................................

.................................................................................................................................

2.2 ස්ථිර පදිංචි ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ....................................................................................

.................................................................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය : .......................................................................................................

.................................................................................................................................

2.4 දුරකථන අංකය :- ...................................................................................

03. 3.1 ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - F [ ] පුරුෂ - M [ ]

3.2 උපන් දිනය :- වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

3.3 2019.12.06 දිනට වයස : අවුරුදු : [ ][ ] මාස : [ ][ ] දින : [ ][ ]

04. 4.1 අයදුම්කරු පදිංචි පරිපාලන දිස්ත්‍රික්කය :- ..................................................................................................

4.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :- ..................................................................................................

4.3 ග්‍රාම නිලධාරී කොට්ඨාසය :- ..................................................................................................

4.4 2019.12.06 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය :- අවුරුදු :...................., මාස :......................., දින :.......................

05. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම් :-*

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

විභාගයේ වර්ෂය හා මාසය : ...............................
විභාග අංකය : ................................

| | *විෂයය* | *සාමාර්ථය* | | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 01 | | | 06 | | |
| 02 | | | 07 | | |
| 03 | | | 08 | | |
| 04 | | | 09 | | |
| 05 | | | 10 | | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර :

විභාගයේ වර්ෂය හා මාසය : ...............................
විභාග අංකය : ................................

| | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

5.3 *වෘත්තීය සුදුසුකම්.-*

| *ආයතනය* | *හදාරා ඇති පාඨමාලාව* | *කාලසීමාව* | *සාමාර්ථය* | *සහතිකපත් අංකය හා දිනය* |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

06. *විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :*

6.1 ලදුපත් අංකය : ................................................ මුදල : ................................................
දිනය : .................................................................
නිකුත් කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය : .......................................................

| |
|---|
| ලදුපත මෙහි අලවන්න. |

07. *අයදුම්කරුගේ සහතිකය :*

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ද, මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට ද එකඟ වෙමි.

(ආ) ම විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් මෙම තනතුරට පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම් ලැබීමෙන් පසු සේවය අවසන් කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

..........................................;
අයදුම්කරුගේ අත්සන.

දිනය : ..............................

08. *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙහි අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 32,960/- කට වැඩි මූලික මාසික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් සහතික කළ යුතුය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................................. මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ................................ දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

අත්සන : ......................................................................
සහතික කරන අයගේ නම : ......................................................................
තනතුර හා නිල මුද්‍රාව : ......................................................................
දිනය : ......................................................................

11-1297